## පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 2015
-------------------------

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර, විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම
----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** මූල්‍ය ප්‍රකාශන

-------------------

**2.1** තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

**2.2.1** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

---------------------------------------------

(i) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ ගිණුම් සටහන 1.2 අනුව උපචිත පදනමට ගිණුම් පිළියෙල කරන බව දක්වා තිබුණද, විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල් ගිණුම් ඊට පටහැනිව මුදල් පදනම මත පිළියෙල කර තිබුණි.

(ii) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවද, අරමුදල් ගිණුම් 05 ක එකතුව රු. 2,768,380 ක් වූ හර ශේෂය අරමුදල් බැර ශේෂ සමඟ හිලව් කර ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

---------------------------------------------

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 447,379 ක් වූ ගෘහ භාණ්ඩ හා සවි කිරීම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09
---------------------------------------------

(i) හුවමාරු නොවන ගනුදෙනුවක් මාර්ගයෙන් අස්ථිත්වයට පවරනු ලැබූ තොගයක්, එය අත්පත්කරගත් දිනට පවතින සාධාරණ වටිනාකම පදනම් කරගෙන ගිණුම්ගත කළ යුතු වුවත්, දන්ත වෛද්‍ය පීඨයට ජයිකා (JICA) ව්‍යාපෘතියෙන් පරිත්‍යාග ලෙස ලැබුණු තොග අයිතම් 90 ක් එසේ ගිණුම්ගත කර නොතිබුණි.

(ii) විශ්වවිද්‍යාලය සතු වෙනත් අරමුදල් 07 කින් වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ රු.12,897,191 ක් වූ ගබඩා ද්‍රව්‍යවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වෛද්‍ය පීඨයේ ව්‍යාධිවිද්‍යා (Pathology) දෙපාර්තමේන්තුව සතු රු. 1,877,853 ක රසායනික ද්‍රව්‍ය අයිතම් 153 ක්, වෛද්‍ය පීඨයේ හා විද්‍යා පීඨයේ රසායනික ද්‍රව්‍ය අයිතම් 667 ක සහ රසායනාගාර උපකරණ අයිතම් 740 ක වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 ජනවාරි 03 දිනැති අංක 843/845 දරන ගැසට් නිවේදනය අනුව පිහිටුවන ලද මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කටයුතු 2015 සැප්තැම්බර් 15 දින සිට විධිමත් පරිදි ආරම්භ කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව පශ්චාත් උපාධි ආයතනය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකර විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ කාලයට අයත් රු.1,885,872 ක ආදායම හා රු.16,948,455 ක වියදම ඇතුළත් කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.15,062,583 ක් වැඩියෙන් දක්වා තිබූ අතර ඊට අදාළ රු.11,910,487 ක් වූ අරමුදල වෙනත් අරමුදල් යටතේ දැක්වීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඇ) 1956 - 1959 කාලය තුළ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කර ගෙන ඇතත්, මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොමැති කුරුඳුගොඩැල්ල, උඩපේරාදෙණිය, මහකන්ද ගල්බංගලාව සහ දන්ත වෛද්‍ය පීඨයට අයත් අක්කර 1120 රූඩ් 3 පර්චස් 21.8 ක් වූ ඉඩම්වල වටිනාකම රජයේ පිළිගත් තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කර ගිණුම්ගත කිරීමට විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

(ඈ) අවුරුදු 30 ක කාලයක් සඳහා උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු ගැටඹේ පර්චස් 40.97 ක ඉඩමට අදාළව 1992 දෙසැම්බර් 31 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා විශ්වවිද්‍යාලය වෙත අයවිය යුතු රු.5,960,000 ක හිඟ බදු මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ආපදා ණය ලෙජරය සහ උපලේඛන අතර රු.375,584 ක වෙනසක් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ශේෂය රු. 728,385 ක් දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) කෘෂිකර්ම විද්‍යා පීඨයේ වර්ෂයේ සතුන් මිලදී ගැනීම් ලෙස රු. 2,163,049 ක් ගිණුම්ගත කර ඇතත් භෞතික සත්‍යාපන වාර්තා අනුව එය රු. 2,356,049 ක් වූ බැවින් රු.193,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ එකතුව රු.1,410,024,855 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පර්යේෂණ දීමනා | 150,113,165 | අදාළ පර්යේෂණ වාර්තාවන් සහ ප්‍රගති වාර්තා |
| (ආ) | උපදේශන සේවා සැපයීමට සහය දැක්වීම වෙනුවෙන් නිලධාරීන් 99 දෙනෙකු සඳහා ගෙවන ලද දීමනා | 1,334,750 | දීමනා ලැබූ නිලධාරීන් ඉටු කරන ලද කාර්යභාරය පිළිබඳ තොරතුරු |
| (ඇ) | විවිධ ණයහිමි ශේෂය | 385,319 | ණයහිමි ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (ඈ) | ලැබිය යුතු ශේෂ | 12,686,402 | උපලේඛන හා ශේෂ සනාථ කිරීම් |
| (ඉ) | වෙනත් අරමුදල් 160 ක වියදම් හා ආදායම් | 506,962,065<br>639,322,256 | ආදායම් වියදම් වර්ගීකරණ |
| (ඊ) | විවිධ අරමුදල් 201 කට අදාළ මුදල් උපයෝජනය කිරීම් | 99,220,898 | ශේෂ සනාථ කිරීම් |
| | එකතුව | 1,410,024,855 | |

**2.3** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 1,112,996 ක් වූ වසර 02 කට වඩා පැරණි ණය ශේෂ 19 ක් සහ එකතුව රු.180,787 ක් වූ වසරකට වඩා පැරණි ණය ශේෂ 02 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය විසින් විශ්වවිද්‍යාලයීය තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු 2002 වර්ෂයේ නිම කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් කාර්යාංශය වෙත ගෙවිය යුතු රු.2,401,745 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය සතු නිල නිවාසවලින් සහ විශ්වවිද්‍යාල භූමිය බාහිර පාර්ශවයන්ට කුලියට දීමෙන් 2014 වර්ෂයේ සිට ලැබිය යුතු කුලී, ජල හා විදුලි බිල්පත්වල එකතුව රු. 4,438,308 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දිගු කාලයක සිට අය නොවී පවතින විවිධ අත්තිකාරම් එකතුව රු.1,300,526 ක් හා උත්සව අත්තිකාරම් රු.170,102 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ වෛද්‍ය ප්‍රදර්ශනය වෙනුවෙන් ලබා දී තිබුණු වෙළඳ කුටි 07 කින් එකතුව රු.392,400 ක් වූ කුලී ආදායම සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2014 / 2015 අධ්‍යයන වර්ෂයට බඳවා ගත් සිසුන් 2945 කට අදාළව ලැබිය යුතු ලියාපදිංචි ගාස්තුවෙන් සියයට 69 ක් වූ එකතුව රු.2,899,000 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගෙන් වැඩිපුර අයකර ගෙන තිබූ රු.2,898,522 ක වටිනාකම නිරවුල් කිරීමට කටයුතු නොකර, සමාලෝචිත වර්ෂයේදී එම වටිනාකමින් රු. 1,622,289 ක් ආදායමට ගෙන තිබුණි.

(ඌ) වර්ෂ ගණනාවක සිට අය නොවී පැවත එන කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද රු.1,079,967 ක සංචලීකරණ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව වෙත බදු පදනමට ලබා දී තිබූ පර්චස් 25 ක ඉඩමකින් 1997 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දක්වා අය විය යුතු රු. 8,174,000 ක හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) 1980 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා වූ කාලය තුළ පාඨමාලා හැර ගොස් සිටි පීඨ 07 කට අයත් ශිෂ්‍යයින්ගෙන් ලැබිය යුතු ශාලා ගාස්තු හා දඩ මුදල් එකතුව රු. 2,090,524 ක් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඔ) 1970 වර්ෂයේ සිට 1999 වර්ෂය දක්වා වූ කාලපරාසය තුළ ගිවිසුම් කඩකළ ආචාර්යවරුන් සහ නිලධාරීන් 84 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 36,007,739 ක් වූ ඇප බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ඒ තුළ 50 දෙනෙකුගෙන් අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු.27,038,176 ක් ගිවිසුම් කඩකළ දින සිට අය කර ගෙන නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත<br>(i) XIII වන කොටසේ 99(1) වගන්තිය | විශ්වවිද්‍යාල සඳහා ලැබෙන සියලු ආදායම් හා එහි සියලු වියදම් විශ්වවිද්‍යාල අරමුදල මගින් සිදුකළ යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි පවත්වාගෙන ගොස් තිබූ අරමුදල් 201 ක සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට රු. 883,553,591 ක ශේෂයක් පැවතුණි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 හා 2015 සැප්තැම්බර් 12 දිනැති අංක කම්.දෙ./රවි/15/2015 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපි | සේවක අර්ථසාධක අරමුදල් දායකය, විශ්‍රාම වැටුප් අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ගණනය කිරීමේදී අධ්‍යයන දීමනාව අදාළ කර නොගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ පීඨ සහ ඒකක 14 ක අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් අධ්‍යයන දීමනාව ඇතුළත් කර ඉහත අරමුදල්වලට දායකය ගණනය කිරීම නිසා රු. 90,647,530 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යන සෑම තැනැත්තෙකුම බදු අයකළ හැකි භාණ්ඩ හා සේවා සැපයුම වර්ෂයකට රු.15,000,000 ක් ඉක්මවා ඇතිනම් එකතුකළ අගය මත බදු ගෙවීම කළයුතු වුවත්, විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානයේ 2013 සිට 2015 වර්ෂයන්වලදී රු.48,958,408 ක උපදේශන සේවා සපයා තිබුණද එකතුකළ අගය මත බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී නොතිබීම නිසා රු.5,385,424 ක බදු ආදායමක් රජයට අහිමි වී තිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>XXIV ඡේදයේ 3.7 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සහ දෙසැම්බර් මාසවලට අදාළව විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ එකතුව රු.7,335,131 ක් වූ ණය වාරික අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 756 සහ 757, 770(3) | වෛද්‍ය, ඉංජිනේරු, පශු වෛද්‍ය, දන්ත වෛද්‍ය, කෘෂිකර්ම හා සම සෞඛ්‍ය පීඨවලට අයත් දෙපාර්තමේන්තුවල හා විද්‍යා පීඨයේ දෙපාර්තමේන්තු 05 කද, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේද, 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය වාර්තාවේ දිනය තෙක් සිදු කර නොතිබුණි.<br><br>ජල වැඩ ගබඩාව, ඉංජිනේරු පීඨය, පොදු ගබඩාව, සිවිල් නඩත්තු ගබඩාව හා මාවලවත්ත ගොවිපලෙහි යල්පැනගිය හා සෙමින් චලනය වන එකතුව රු. 2,572,603 ක් වූ අයිතම 207 ක් සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 772 | පෙර වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් පෙන්වා දී තිබුණු විද්‍යා පීඨයට අයත් සත්ත්ව විද්‍යා සහ ජීව විද්‍යා දෙපාර්තමේන්තුවල 2016 අගෝස්තු 16 දින වන විට එකතුව රු.658,937 ක කල් ඉකුත් වූ රසායනික ද්‍රව්‍ය සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ඊ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | I කොටසේ III පරිච්ඡේදයේ 26 ඡේදය | බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් දේශනයකට වැය වන මුදල ඉතා අධික වන හෙයින් බාහිර කථිකාචාර්යවරුන් ලබා ගැනීම අධෛර්ය කළයුතු බවට උපදෙස් දී ඇතත් ඊට පටහැනිව, පීඨ 03 කට අදාළව බාහිර කථිකාචාර්යවරුන් 87 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.2,121,304 ක ගාස්තු ගෙවා තිබුණි. |
| (ii) | II කොටසේ VIII පරිච්ඡේදයේ 6.2 හි (ii) හා (iii) ඡේද | තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයාගන්නා ගාස්තු ප්‍රමාණයෙන් සියයට 10 ක් තමන් අයිති උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු වුවද, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත විවිධ සේවාවන් වෙනුවෙන් සිදු කළ ගෙවීම්වලට අදාළව එකතුව රු. 1,931,534 ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | II කොටසේ IX පරිච්ඡේදයේ 2.1 හා 2.2 ඡේද | අතිකාල වැඩ සඳහා බලය දිය හැක්කේ සාමාන්‍ය වැඩ කටයුතුවලින් ඒකාන්තයෙන් පරිබාහිර වූද, හදිසිවූද, සාමාන්‍ය කාර්යාල වේලාව තුළ කළ නොහැකි වූ වැඩ සඳහා පමණක් වුවත්, ශාස්ත්‍ර පීඨයේ වැඩ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.2,819,348 ක මුදලක් අතිකාල දීමනා වශයෙන් ගෙවා තිබුණි. |
| (iv) | II කොටසේ XX වැනි පරිච්ඡේදයේ 3.1 හා 3.2 ඡේද | පැමිණීම් හා පිටවීම් සනාථ කර ගැනීමකින් තොරව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා වේතන වශයෙන් රු.1,959,408,417 ක් ගෙවා තිබුණි. |
| (v) | II කොටසේ XXV වැනි පරිච්ඡේදයේ 2.2 (ඊ) ඡේදය | 2013 වර්ෂය තුළ වාහන අනතුරු මඟින් සිදු වී ඇති රු. 103,980 ක අලාභය 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (vi) | II කොටසේ XXVI වැනි පරිච්ඡේදයේ 2.1 ඡේදය | මුදල් වර්ෂය අවසාන වන දිනයේදී කොමිෂන් සභාවට සහ උසස් අධ්‍යාපන ආයතනයට අයත් ස්ථාවර වත්කම්, ඒ කාර්යය සඳහා පත් කරනු ලබන සමීක්ෂණ මණ්ඩලයක් විසින් සත්‍යාපනය කළ යුතු වුවද, වර්ෂ 15 ක කාලයක සිට ඉංජිනේරු පීඨ පුස්තකාලයේ පොත් සම්බන්ධයෙන් එලෙස සත්‍යාපනයක් සිදුකර නොතිබුණි. |
| (ඌ) | 1990 පෙබරවාරි 06 දිනැති අංක 422 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය, 2003 ජනවාරි 09 දිනැති අංක PE 1/174/1-2003 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ අවසරයක් නොමැතිව ගාස්තු / දිරිදීමනා හා විශේෂ දීමනා ගෙවිය නොහැකි වුවද, සමාලෝචිත වර්ෂයේදී, විශ්වවිද්‍යාලයේ හා පීඨයන්වල නිලධාරීන් සහ සේවකයින් 260 දෙනෙකු වෙත ගෞරවාන්විත දීමනා හා සම්බන්ධීකරණ දීමනා ලෙස එකතුව රු.2,792,050 ක් හා තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථානයේ සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ පාඨමාලා සම්බන්ධීකරණ ගාස්තු ලෙස රු. 1,050,522 ක් ඉංජිනේරු පීඨයේ සහකාර මූල්‍යාධිකාරී වෙත මූල්‍යාධිකාරී දීමනා හා ගෞරවාන්විත දීමනා ලෙස රු. 40,000 ක්ද ගෙවීම් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඌ) | 2004 ජූලි 29 දිනැති අංක PED 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව හා පාලක මණ්ඩලයේ අනුමැතිය රහිතව එකතුව රු.66,995,652 ක් රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (එ) | 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය හා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටසේ VII වන පරිච්ඡේදය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ශාස්ත්‍ර පීඨයේ වෙනත් අරමුදල්වලින් රු. 357,750 ක දීමනා ගෙවා තිබුණි. |

**2.5** ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉංජිනේරු පීඨයේ ස්ථාපිත කර ඇති පරිගණක මධ්‍යස්ථානයෙහි පරිගණක හා අනෙකුත් උපාංග මඟින් පශ්චාත් උපාධි අපේක්ෂකයින්ට සහ පීඨයෙන් පිටස්තර ආයතන වෙත සේවා ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට රු.234,000 ක ආදායමක් උපයාගෙන ඇතත් එවැනි සේවා සැපයීම සහ ගාස්තු අයකිරීම සඳහා වූ විධිමත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) ශාස්ත්‍ර පීඨය යටතේ පවත්වාගෙන යමින් තිබූ පශ්චාත් උපාධි පාඨමාලා අරමුදලේ පරිපාලන කටයුතු සිදු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ශාස්ත්‍ර පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට එකතුව රු. 1,121,044 ක් ගෙවීම් කොට ඇතත්, ඒ සඳහා වූ විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවුනි.

**3.** මූල්‍ය සමාලෝචනය

----------------------

**3.1** මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.139,547,815 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.37,090,295 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.176,638,110 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික වියදම් රු.740,676,210 කින් වැඩි වුවද, පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. 809,878,422 කින් හා මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදාන රු. 71,425,200 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වාම මූල්‍ය ඌනතාවයක් ඇති වී තිබූ අතර, 2015 වර්ෂයේදී මූල්‍ය අතිරික්තයක් ඇති වී තිබුණි. එමෙන්ම සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකීමේදී 2011 වර්ෂයේ රු.1,861,686,183 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2015 වර්ෂයේදී රු.4,249,095,639 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය සඳහා මානව ප්‍රාග්ධන සංවර්ධන (Human Capital Development) ව්‍යාපෘතිය වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණු රු.10,500,000 ක් ව්‍යාපෘතියේ අරමුණට පටහැනිව වෙනත් ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් සඳහා උපයෝජනය කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ පීඨය පිහිටුවීමේ අතිවිශේෂ ගැසට් පත්‍රය පරිදි පීඨයට අයත් සියළුම නව දෙපාර්තමේන්තු පිහිටුවීම, ඉදිරි කටයුතු සිදු කිරීම සහ විෂය නිර්දේශ සකස් කිරීම, සිදුකර ඇති බවට සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුනි.

(ආ) ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානය විසින් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. 22,291,960 ක් වූ උපදේශන සේවා සැපයීම් 68 ක් සිදු කර තිබුණද, එකී සේවාවන් සැපයීමට භාරගැනීමේදී මධ්‍යස්ථාන කළමනාකාරිත්වය විසින් අදාළ පාර්ශවයන් සමඟ විධිමත් ගිවිසුමකට ඇතුළත්ව නොතිබුණි.

(ඇ) වෙනත් ආදායම් තුළ ඍජු ප්‍රේෂණ ලෙස දක්වා තිබුණු එකතුව රු.786,714 ක ලැබීම් ශේෂ 35 ක් හඳුනා ගැනීම සඳහා කළමනාකාරීත්වය විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 95 දෙනෙකු සඳහා පමණක් ශිෂ්‍ය නේවාසිකාගාර කාමර වෙන්කර තිබුණද නිලධාරීන් 212 දෙනෙකු නේවාසිකව සිටි බව නිරීක්ෂණය විය.

(ඉ) අවශ්‍යතාවය නිසි පරිදි ඇස්තමේන්තු කිරීමකින් තොරව වෛද්‍ය ප්‍රදර්ශනය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 391,000 ක් වැය කර මුද්‍රණය කරන ලද ප්‍රවේශපත් 850,000 කින් රු.297,517 ක වටිනාකමක් ඇති ප්‍රවේශපත් 646,776 ක් එනම් සියයට 76 ක් ඉතිරි වී තිබුණි.

(ඊ) කළමනාකරණය සමඟ ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව, 2012 වර්ෂයේ සිට විශ්වවිද්‍යාල භූමිය තුළ පෞද්ගලික සමාගමක් විසින් සම්ප්‍රේෂණ කුළුණක් ඉදිකර තිබුණි. ඒ සඳහා බදු මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) විශ්වවිද්‍යාල පනතේ IX වන පරිච්ඡේදයේ 55(ආ) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව, 2002 නොවැම්බර් 25 දිනැති අංක 309 දරන පාලක සභා තීරණය මත 2002 වර්ෂයේදී දන්ත සහායක පුහුණු පාසැල ආරම්භ කර එදින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වාම පුහුණු පාසැල පවත්වා ගෙන යමින් අදාළ පාඨමාලා පවත්වා සහතිකපත්‍රද ප්‍රදානය කර තිබුණි.

(ඍ) විශ්වවිද්‍යාලයේ පිරිමි නේවාසිකාගාරයක කාමර 97 ක ඇඳන් 356 ක් යොදා ඇති නමුත්, ශිෂ්‍යයින් 278 ක් පමණක් අනුයුක්ත කිරීමට පාලන අධිකාරිය කටයුතු කර තිබුණු බැවින් ශිෂ්‍යයින් 78 කට නේවාසික පහසුකම් සැපයීමට ඇති අවස්ථාව අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

**4.3** මතභේදයට තුඩුදෙන ගනුදෙනු
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාජ සේවා, සුභසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2015 පෙබරවාරි 20 දිනැති අංක MLRCD/05/07/703-11 දරන ලිපිය මඟින්, වසර තුනක කාලයක් සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු හා එහි සභාපති වශයෙන් පත් කර තිබූ මහාචාර්යවරයෙකුට වයස අවුරුදු 64 සම්පූර්ණ වන 2015 ජූලි 20 දිනෙන් පසුවද මාස 04 දින 11 ක් නිවාඩු අනුමත කර තිබුණි. එසේම විගණන දිනය වූ 2015 නොවැම්බර් 24 දින වන විටත් විශ්වවිද්‍යාලයේ සේවයට වාර්තා කර නොතිබුණි.

(ආ) කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශයේ ලේකම්ගේ 2003 ජනවාරි 22 දිනැති ලිපිය මඟින් ද්විතීයනය පදනම මත එක් වසරක් සඳහා 2002 නොවැම්බර් 21 දින සිට කොමසාරිස් ජනරාල් (පශු සම්පත්) තනතුරට පත්කළ, විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකුට විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අංක AE/05 හා 2002 නොවැම්බර් 25 දිනැති ලිපියෙන් 2002 නොවැම්බර් 21 දින සිට 2003 නොවැම්බර් 20 දින දක්වා වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු අනුමත කර, විශ්වවිද්‍යාලයීය ආයතන සංග්‍රහයේ I කොටසේ V පරිච්ඡේදයේ 2.3.2 වගන්තියට පටහැනිව එම කාලපරිච්ඡේදය සඳහා වැටුප් හා දීමනා වශයෙන් විශ්වවිද්‍යාල අරමුදලින් එකතුව රු.596,307 ක මුදලක්ද පශු සම්පත් අමාත්‍යාංශයෙන් රු.263,250 ක මුදලක්ද ගෙවා තිබුණි.

(ඇ) ඉංජිනේරු පීඨයේ දෙපාර්තමේන්තු මඟින් වෙනම අරමුදල් පිහිටුවා, විධිමත් අනුමැතියකින් තොරව, එම පීඨය සතු භෞතික සම්පත් සහ මානව සම්පත් යොදා ගනිමින්, පශ්චාත් උපාධි පාඨමාලා පවත්වා ගෙන යන අතර, 2015 නොවැම්බර් 30 දිනට එම පාඨමාලාවලින් ලැබුණු එකතුව රු.44,208,476 ක් විශ්වවිද්‍යාලීය අරමුදලට බැර නොකර එම අරමුදල්වල පවත්වාගෙන තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ දෛනිකව සිසුන් ප්‍රවාහනය කිරීමේ කටයුතු සඳහා මාසිකව කුලී ගෙවීමේ පදනම මත වර්ෂයක ගිවිසුම් කාලයකට බස් රථ 02 ක් ලබා ගැනීම වෙනුවෙන් ලංසු කැඳවා ඉදිරිපත් වූ අවම මිල නොසලකා වැඩි මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවකු තෝරාගෙන තිබූ අතර, කිසිදු ගිවිසුමක් නොමැතිව 2014 අප්‍රේල් සිට 2015 සැප්තැම්බර් දක්වා බස් රථ කුලී සහ ඉන්ධන වෙනුවෙන් රු.3,181,046 ක් ගෙවා තිබුණි.

(ඉ) ඉංජිනේරු පීඨය යටතේ උපදේශන සේවා සැපයීම සඳහා ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානය පිහිටුවා තිබියදී, ඉන් පරිබාහිරව ඉංජිනේරු පීඨ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන්ට උපදේශන සේවා සැපයීම සඳහා "උපදේශන සේවා ව්‍යාපෘතිය" නමින් වෙනම අරමුදලක් පිහිටුවා සමාලෝචිත වර්ෂය තුළ එම අරමුදල මඟින් රු. 1,220,172 ක ආදායමක් උපයාගෙන, නිලධාරීන් සඳහා දීමනා වශයෙන් රු. 566,932 ක් ගෙවීම් කිරීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.4,609,234 ක ශේෂයක් වෙනත් අරමුදල් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතුව සිටි කථිකාචාර්යවරියක් ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලය සමග එළඹ තිබූ රු. 3,563,966 ක ඇප බැඳුම්කර ගිවිසුම අනුව බන්ධිත සේවා කාලය සම්පූර්ණ නොකර, 2016 ජනවාරි 01 දින සිට සේවයෙන් ඉල්ලා අස්වීම විශ්වවිද්‍යාල කළමනාකාරිත්වය විසින් පිළිගෙන ඇතත් එම ඇප බැඳුම්කර මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) විශ්වවිද්‍යාල ආයතනය සංග්‍රහය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කළ 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන චක්‍රලේඛයට පටහැනිව, කලා පීඨයේ සම්භාව්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කථිකාචාර්යවරයෙකුට, පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම වෙනුවෙන් ශාස්ත්‍ර පීඨය මගින් ක්‍රියාත්මක කරන ගිවිසුම් කඩකරන්නන්ගෙන් ලැබෙන අරමුදල (Bond Violation Fund) මගින් රු.1,000,000 ක ණය මුදලක් පොලී අයකිරීමකින් තොරව ලබාදී තිබුණි. මෙම කථිකාචාර්යවරයාට 2014 දෙසැම්බර් 20 දින සිට 2016 මාර්තු 19 දින දක්වා වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාදී තිබීම හේතුවෙන් ණය මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

4.4 අරමුදල් උපයෝජනය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශාස්ත්‍ර පීඨයේ නීති දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා 2014 දෙසැම්බර් 08 දින සිට වෙන් කර තිබූ රු. 8,701,011 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත්, අරමුණුගත කාර්යයන් සඳහා යොදවා ගෙන නොතිබුණු අතර, එම පීඨයේ 2014 හා 2015 වර්ෂවල දී පර්යේෂණ 06 ක් සඳහා ලබා දී තිබුණු එකතුව රු.3,672,000 ක් වූ අරමුදල්ද සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) කෘෂිකර්ම විද්‍යා පීඨයේ ශිෂ්‍යයින් සඳහා ශිෂ්‍යත්ව හා ශිෂ්‍ය සංගම්වල ක්‍රියාකාරීත්වයන් සඳහා පෞද්ගලික ආයතන කිහිපයක් විසින් 2015 ජූලි 31 දින දක්වා, ලබා දුන් රු.1,500,000 ක මුදලක් අරමුණු ගත කාර්යයන් සඳහා යොදා නොගෙන 2015 ජූලි 12 සහ 2015 දෙසැම්බර් 11 යන දිනවලදී ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි.

(ඇ) වෙනත් අරමුදල් ශේෂ 63 ක එකතුව රු. 35,832,417 ක්, ඒවායේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඵලදායී ලෙස ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවති අතර, පරිත්‍යාග අරමුදල් 95 ක එකතුව රු. 68,322,503 ක් මගින් කිසිදු ශිෂ්‍යත්වයක් හෝ ත්‍යාගයක් ලබා දීමකින් තොරව නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා ප්‍රාග්ධන වැය ශීර්ෂ යටතේ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදලින් රු. 2,534,893 ක් පුනරාවර්තන වියදම් දැරීම සඳහා යොදාගෙන තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂවලදී භාණ්ඩාගාරය විසින් ලබාදුන් මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට රු.534,201,585 ක් අදාළ ව්‍යාපෘතිවල අරමුණ වෙනුවෙන් උපයෝජනය කර ගෙන නොතිබුණු අතර, කාර්යාල ලී බඩු, මෝටර් රථ සහ පොත් හා සඟරා මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.442,726,800 ක් වියදම් දරා තිබුණි.

**4.5** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශාස්ත්‍ර පීඨ ශිෂ්‍යයින්ගේ නවෝත්පාදන සංවර්ධන ව්‍යාපෘතිය විසින් (Invatory Development of Art Student) ශාස්ත්‍ර පීඨය සඳහා ලබා දී තිබූ රු.4,651,643 ක් වටිනා පරිගණක හා උපකරණ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන කාමර අංක 07 හි ගබඩා කර තිබූ අතර 2015 අගෝස්තු මස භූගෝල විද්‍යා අධ්‍යයනාංශය වෙත මිලදී ගත් එකතුව රු.249,972 ක් වූ ප්‍රදර්ශක 04 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් භාවිතා නොකර පැවතුණි.

(ආ) ඉංජිනේරු පීඨයේ නව පරිගණක මධ්‍යස්ථානය සඳහා 2014 දෙසැම්බර් 23 දින රු.5,294,100 කට පරිගණක 50 ක් මිලදී ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අදාළ මධ්‍යස්ථානය ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් එම පරිගණක යන්ත්‍ර නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ ගබඩා 04 ක එකතුව රු. 468,778 ක් වූ විවිධ උපකරණ අයිතම 56 ක් නිෂ්කාර්යව පැවතුණි.

**4.6** හඳුනාගන්නා ලද පාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගෘහස්ථ ක්‍රීඩාගාරයේ විදුලි පද්ධතිය නවීකරණය කිරීමට අදාළව 2013 වර්ෂයේදී නිසි අධ්‍යයනයකින් හා අවශ්‍යතාවය හඳුනා නොගෙන නිසි ප්‍රමිතියකින් තොරව විදුලි බුබුළු මිලදී ගැනීම නිසා රු.3,010,500 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයීය කළමනාකාරීත්වය විසින් විධිමත් පරිදි කටයුතු නොකිරීම හේතුවෙන්, වෛද්‍ය පීඨයේ ව්‍යවච්ඡේද විද්‍යා දෙපාර්තමේන්තුවේ සේවය කළ මහාචාර්යවරියක විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව ගොනු කර තිබූ පැමිණිල්ලකට, උසාවිය මඟින් දෙන ලද නියෝගයක් අනුව 2015 දෙසැම්බර් 02 වන දින මහනුවර කම්කරු කොමසාරිස් වෙත ගෙවිය යුතු දායක මුදල් හා අධිභාර මුදල් රු. 192,398 ක්ද, මහාධිකරණයේ ගොනු කර තිබූ ප්‍රතිශෝධන ඉල්ලුම්පත්‍රය නිෂ්ප්‍රභා කිරීමේ ගාස්තු රු.10,000 ක්ද වශයෙන් රු.202,398 ක් විශ්වවිද්‍යාල අරමුදලින් අදාළ මහාචාර්යවරියට ගෙවා තිබුණි.

**4.7** ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පාලනය

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 වගන්තියට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.371,606,922 ක් වූ ව්‍යාපෘතීන් 69 ක් වෙනුවෙන් විනිවිද භාවයකින් තොරව ලංසු විවෘත කිරීම හා අවම මිල තීරණය කිරීම සිදුකර තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තියේ විධිවිධානවලට පටහැනිව විශ්වවිද්‍යාල පරිශ්‍රයේ හා මහඉලුප්පල්ලම විශ්වවිද්‍යාල උප ඒකකයේ එකතුව රු.1,200,000 ක වටිනාකමින් යුතු නළ ළිං 04ක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ගිවිසුම් රහිතව කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු හට පවරා සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,172,000 ක් ගෙවීම් කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය 2012 වර්ෂයේදී අසාදු ලේඛනගත කරන ලද ආයතනයක් වෙත රු. 5,338,089 ක වටිනාකමින් යුතු කොන්ත්‍රාත් 03 ක් 2015 වර්ෂයේදී පිරිනමා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ තෙමහල් ශෛල්‍ය වාට්ටුවක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව පිඹුරුපත් සඳහා අනුමැතියක් සහ සංවර්ධන බලපත්‍රයක් ලබාගෙන නොතිබුණු අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් සහ භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන්ද භූමිය පිළිබඳ යෝග්‍යතා සහතිකයක් ලබාගෙන නොතිබුණි.

(ඉ) විද්‍යා පීඨයේ සංඛ්‍යානය හා පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළව ලබා ගත් නායයෑම් පිළිබඳ යෝග්‍යතා සහතිකය අනුව, මෙම භූමියේ නායයෑම් පිළිබඳව දැඩි අවදානමක් පවතින බවත්, ඉදිකිරීම් සිදුකරන්නේ නම් වාර්තාවේ දක්වා ඇති කොන්දේසි පදනම්ව කලයුතු බවත් දක්වා තිබු බැවින් සහ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) ගේ ලිපියෙන් මෙම ගොඩනැගිල්ල සඳහා වෙනත් සුදුසු ස්ථානයක් තෝරා ගන්නා ලෙසත්, දැනට බිම් සකස් කළ ස්ථානය එකී ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සුදුසු නොවන බව දන්වා තිබීම හේතුවෙන් එම වාර්තා ලබා ගැනීමට පෙර කොන්ත්‍රාත්තුව වෙනුවෙන් දැරූ එකතුව රු.12,498,457 ක් විශ්වවිද්‍යාල අරමුදලට අලාභයක් වී තිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාර 03 ක් සඳහා උපකරණ කට්ටල මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය වෙනුවෙන් ලද අවම මිල ප්‍රතික්ෂේප කර වෙනත් සැපයුම්කරුවකුට ලබා දීම හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට රු. 5,366,780 ක පාඩුවක් සිදුවී තිබුණි. අවශ්‍යතාවය නියමිත පරිදි හඳුනා ගැනීමකින් තොරව මිල කැඳවීම හේතුවෙන් උපකරණ කට්ටල ප්‍රමාණය 1400 සිට 1220 කට අඩුකර තිබූ අතර, පිරිවිතරවලට අනුව දැව නියමිත වර්ගයේ ඒවාදැයි වැඩ ඉංජිනේරු විසින් පරීක්ෂාකළ බවට සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුනි.

**4.8** විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම
--------------------------------------------------------------------

විශ්වවිද්‍යාලයට අයත් මහඉලුප්පල්ලම උප විශ්වවිද්‍යාල ඒකකය ස්ථාපිත කර ඇති ඉඩමේ හිමිකාරීත්වය විශ්වවිද්‍යාලය වෙත පවරා නොගෙන, ඉකුත් වර්ෂයේදී රු.1,738,367 ක වටිනාකමින් යුතු ඉදිකිරීම් සිදු කර තිබුණි.

**4.9** කාර්ය මණ්ඩල පරිපාලනය
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වන විට ආරම්භ කර වර්ෂ 21 ක කාලයක් ගත වී ඇති ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු නොකර පැවරුම් පදනම මත තනතුරු 06 ක් සඳහා නිලධාරීන් 07 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කෘෂිකර්ම විද්‍යා පීඨයට අයත් මාවලවත්ත ගොවිපලේ තනතුරු 05 ක පුරප්පාඩු 16 ක් පවතින බවත්, මෙම පුරප්පාඩු හේතුවෙන් ගොවිපලේ වැඩකටයුතු සිදු කරගෙන යාමේ විවිධ අපහසුතා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) පශු වෛද්‍ය රෝහල නඩත්තු කිරීමේ අරමුදලින් සමාලෝචිත වර්ෂය තුළ අනුමැතියකින් තොරව බඳවා ගත් කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ලෙස එකතුව රු.1,891,522 ක් ගෙවා තිබුණි.

(ඇ) දන්ත වෛද්‍ය රෝහලේ ජල පවිත්‍රාගාර ඒකකයේ දෛනික පිරිසිදු කිරීම් සහ බාහිර රෝගී අංශයේ රෝගීන් ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය අනුමත කරවා ගෙන ස්ථිර නිලධාරීන් බඳවා ගැනීම වෙනුවට **2013** වර්ෂයේ සිට පැවරුම් පදනම මත බඳවා ගත් පුද්ගලයන් දෙදෙනෙකු මඟින් එම කාර්යයන් කිරීම වෙනුවෙන් රු.**1,880,496** ක් ගෙවීම් කර තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති **03** ට අනුකූලව **2014** වර්ෂයට අදාළව සිදු වී ඇති වැරදි අතීතානුයෝගීව නිවැරදි කිරීමෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ දක්වා ඇති **2014** වර්ෂයේ අගයන්හි ඌනතාවය රු.**377,855,548** කින් අඩුවීමක්ද, මුළු වත්කම් රු.**7,664,304** කින් අඩුවීමක්ද, මුළු වගකීම් රු. **12,836,560** කින් අඩුවීමක්ද, ස්කන්ධය **5,172,258** කින් අඩුවීමක්ද, දක්වා ඇතත්, එම නිවැරදි කිරීම් සඳහා විශ්වවිද්‍යාලයීය පාලක මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක **134(1)** වගන්තිය පරිදි අභ්‍යන්තර විගණනය, ආයතනයේ වැඩ හා සේවාවන් ඉටු කිරීමෙන් හෝ නියුක්ත වූ අයගේ පාලනයෙන් නිදහස් විය යුතු වුවද, ඊට පටහැනි ලෙස නියෝජ්‍ය අභ්‍යන්තර විගණක, **21** වන සියවස් ව්‍යාපෘතියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය) ලෙස රාජකාරී කටයුතු කරමින් **2015** මැයි **05** දින සිට **2016** පෙබරවාරි **09** දින දක්වා එකතුව රු.**81,991,423** ක වටිනාකමින් යුතු ගෙවීම් වවුචර් සහතික කිරීම සිදු කර එම කාලයට අදාළව රු.**97,333** ක දීමනාද ලබාගෙන තිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

**2003** ජුනි **02** දිනැති අංක පීඊඞී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ **5.2** වගන්තිය ප්‍රකාරව, වාර්ෂික අයවැය ලේඛනය වර්ෂයේ අරමුණු ඉටුකර ගැනීම පිණිස උපකරණයක් ලෙස යොදාගත යුතු වුවත්, අයවැයගත හා තථ්‍ය ආදායම් සැසඳීමේදී ආදායම් විෂයයන් **08** ක ඇස්තමේන්තු ආදායම රු. **150,427,996** ක් වැඩියෙන් රැස්කර තිබුණු අතර, ආදායම් විෂයයන් **05** ක ඇස්තමේන්තු ආදායම රු.**4,950,000** ක් රැස්කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01, 07 සහ 09 හි ප්‍රතිපාදන අනුගමනය නොකිරීම. |
| (ආ) | ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් | ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් නියමිත පරිදි නිරවුල් නොකිරීම. |
| (ඇ) | අරමුදල් පාලනය | අරමුදල් සම්බන්ධයෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ දක්වා ඇති ප්‍රතිපාදන අනුව කටයුතු නොකිරීම. |
| (ඈ) | ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිනොපැදීම. |